Department of Education, Sabaragamuwa Province/ Weekly School

**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල**

ශ්‍රේණිය : 6 | විෂය : ගණිතය | සතිය : 4

**පාඩම :- කාලය**

**කාලච්ඡේද ගණන :- 06**


- ඔරලෝසු මුහුණතක සවිකර ඇති කටු තුන පිළිබඳව නිවැරදිව විස්තර කරන්න.
- පෙළපොතේ 38 හා 39 පිටු හොඳින් අධ්‍යයනය කරන්න.
- පැය කටුව, මිනිත්තුකටුව, තත්පර කටුව අතර සම්බන්ධතා නිවැරදිව ලියන්න.

**පැය 1 = මිනිත්තු 60**

**මිනිත්තු 1 = තත්පර 60**


ඔරලෝසු මුහුණතක දක්වා ඇති වේලාව පැය, මිනිත්තු, තත්පර අනුව නිවැරදිව ලියන්න.


උදා:-




වේලාව 01.25.20

පහත දැක්වෙන ඔරලෝසු මුහුණත්වල දැක්වෙන වේලාව පැය, මිනිත්තු, තත්පර ඇසුරින් ලියන්න.









පෙළපොතේ 39 පිටුවේ 4.1 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න.

- පෙළපොතේ 40 පිටුව හොඳින් අධ්‍යයනය කරන්න.
- මධ්‍යාහ්න 12, මධ්‍යම රාත්‍රී 12, පෙරවරුව, පස්වරුව, දිනය නිවැරදිව විස්තර කරන්න.


| **දින 1 = වරු 2 = පැය 24** |
|---|

පහත දැක්වෙන ඔරලෝසු මුහුණත්වල දැක්වෙන වේලාව පෙරවරු, පස්වරු අනුව ලියන්න. ( ඉර,හඳ අනුව පෙරවරු, පස්වරු හඳුනාගන්න.)


උදා:-






පස්වරු 1.30




පෙරවරු 2.55






පෙළපොතේ 42 පිටුව බලන්න. පැය 12 ක්‍රමයට ලියා ඇති වේලාව සම්මත ක්‍රමයට ලිවීමේදී වේලාව දැක්වීම නිවැරදිව අධ්‍යයනය කරන්න.

යා කරන්න.

| **පැය 12 ක්‍රමයට අනුව වේලාව** | **සම්මත ක්‍රමයට අනුව වේලාව** |
|---|---|
| පෙ.ව. 2.00 | 09:45 |
| පෙ.ව. 4.30 | 16:30 |
| පෙ.ව. 9.45 | 02:00 |
| පෙ.ව. 11.30 | 12:00 |
| ප.ව. 4.30 | 24:00 |
| ප.ව. 7.45 | 04:30 |
| මධ්‍යාහ්න 12.00 | 11:30 |
| මධ්‍යම රාත්‍රී 12.00 | 19:45 |

- පෙළපොතේ 43 පිටුවේ 4.2 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න.

- පෙළපොතේ 44 පිටුව අධ්‍යයනය කරන්න.
- සම්මත ආකාරයට දිනය දැක්වීමේ වර්ෂය, මාසය, දිනය යොදන ආකාරය විස්තර කරන්න.

**2020 දෙසැම්බර් 31** වන දින **අන්තර්ජාතික සම්මත ආකාරයට දක්වනුයේ 2020- 12-31 ලෙස වේ.**

පහත දැක්වෙන දිනයන් සම්මත ක්‍රමයට ලියන්න.

1) 1987 ජනවාරි මස 17 වන දින
2) 2010 මාර්තු මස 08 වන දින
3) 2015 ජූලි මස 01 වන දින
4) 2021 ජනවාරි මස 11 වන දින

- පෙළපොතේ 44 පිටුව බලන්න. කාලය මනින ඒකක අතර සම්බන්ධතාව හඳුනාගන්න.

**මිනිත්තු 1 = තත්පර 60**

පහත වගු සම්පූර්ණ කරන්න.

| **කාලය මිනිත්තු** | **කාලය තත්පර** |
|---|---|
| 2 | 2x60 = 120 |
| 8 | |
| 30 | |
| 58 | |

| **කාලය තත්පර** | **කාලය මිනිත්තු** |
|---|---|
| 120 | 120 ÷ 60 = 2 |
| 300 | |
| 240 | |
| 420 | |

- පෙළපොතේ 45 පිටුව බලන්න. 4.3 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න.
- පෙළපොතේ 46 පිටුව කියවන්න. පැය හා මිනිත්තු අතර සම්බන්ධතාව හඳුනා ගන්න.

**පැය 1 = මිනිත්තු 60**

- පෙළපොතේ 46 පිටුවේ 4.5 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න.
- පෙළපොතේ 47 පිටුවේ 4.6 අභ්‍යාසය ද නිවැරදිව සම්පූර්ණ කරන්න.

- පෙළපොතේ 47 පිටුව කියවන්න. දින හා පැය අතර සම්බන්ධතාව හඳුනා ගන්න.

**දින 1 = පැය 24**

**එනම් පැයවලින් දක්වා ඇති කාලයක් දිනවලින් දැක්වීමට, එම කාලය දී ඇති එනම් දී ඇති පැය ගණන 24 න් බෙදිය යුතුය.**

- පෙළපොතේ 48 පිටුවේ 4.7 අභ්‍යාසය ද නිවැරදිව සම්පූර්ණ කරන්න.

- පෙළපොතේ 49, 50 පිටු හොඳින් අධ්‍යයනය කරන්න. යම් කාර්යයක් හෝ යම් සිදුවීමක් හෝ සඳහා ගතවන කාලය සෙවීම පිළිබඳව නිවැරදිව අවබෝධ කරගන්න.

**එකම වරුවක් තුල සිදුවන සිදුවීම් සඳහා පැය 12 ක්‍රමයට කාලය ගණනය කල හැකි අතර එක් දිනයක් තුල සිදුවන සිදුවීම් සඳහා පැය 24 ක්‍රමයට ගතවන කාලය ගණනය කල හැක.**

උදා:- පාසලක උදෑසන රැස්වීම ආරම්භ වූයේ පෙ.ව. 7.30 ට ය. අවසන් වූයේ පෙ.ව. 8.45 ට ය. මේ සඳහා ගත වූ කාලය සොයන්න.

| | පැය | මිනිත්තු |
|---|---|---|
| | 8 | 45 |
| - | 7 | 30 |
| | 1 | 15 |

කාලය පැය 1 යි මිනිත්තු 15 යි.

උදා:- සිරිසුමන විදුහලේ ක්‍රීඩා තරඟ උත්සවය ආරම්භ වූයේ පෙ.ව. 8.30 ට ය. අවසන් වූයේ ප.ව. 3.40 ට ය. උත්සවය පැවති කාලය සොයන්න.

| | | |
|---|---|---|
| ආරම්භක වේලාව | = | 08:30 |
| අවසන් වූ වේලාව | = | 15:40 |
| උත්සවය පැවති කාලය | = | 15:40 - 08:30 |
| | = | පැය 7 යි මිනිත්තු 10 යි. |

- පෙළපොතේ 50,51 පිටුවල ඇති නිදසුන 1, නිදසුන 2 නිවැරදිව අධ්‍යයනය කරන්න.
- පෙළපොතේ 51 පිටුවේ සිට 54 පිටුව තෙක් ඇති 4.8 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න.

- පෙළපොතේ 55 පිටුව හොඳින් අධ්‍යයනය කරන්න. කාලය සම්බන්ධ එකතු කිරීම් සිදුකරන ආකාරය පිළිබඳව නිවැරදිව අවබෝධ කරගන්න.
- පෙළපොතේ 55 පිටුවේ ඇති නිදසුන 1, නිදසුන 2 අධ්‍යයනය කරන්න.

උදා:-

| | පැය | මිනිත්තු |
|---|---|---|
| | 15 | 20 |
| + | 10 | 30 |
| | 25 | 50 |

| | පැය | මිනිත්තු |
|---|---|---|
| | 1 | |
| | 8 | 40 |
| + | 2 | 35 |
| | 11 | 15 |

75 = 60 + 15 → 60 → 1

- පෙළපොතේ 56 පිටුවේ 4.9 අභ්‍යාසය ද නිවැරදිව සම්පූර්ණ කරන්න.

- පෙළපොතේ 58 පිටුව හොඳින් අධ්‍යයනය කරන්න. කාලය සම්බන්ධ අඩු කිරීම් සිදුකරන ආකාරය පිළිබඳව නිවැරදිව අවබෝධ කරගන්න.
- පෙළපොතේ 58 පිටුවේ ඇති නිදසුන 1, 2,3 හා 4 අධ්‍යයනය කරන්න.
- පෙළපොතේ 58 පිටුවේ 4.10 අභ්‍යාසය ද නිවැරදිව සම්පූර්ණ කරන්න.

- පෙළපොතේ 59 පිටුවේ ඇති මිශ්‍ර අභ්‍යාසය ද නිවැරදිව සම්පූර්ණ කර ඔබට මතුවන ගැටළු නිවැරදි කරගන්න.